## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2016

-----------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව, 2018 ජූනි 05 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම

----------------------------------------

සංස්ථාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

### 2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම

-------------------------------------

සංස්ථාව විසින් අවසන්වරට පිළියෙළ කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 5,808,810,849 |
| ජංගම වත්කම් | 284,751,569 |
| මුළු වත්කම් | 6,093,562,418 |
| බැරකම් | |
| ජංගම බැරකම් | 1,072,869,176 |
| ජංගම නොවන බැරකම් | 375,662,227 |
| මුළු බැරකම් | 1,448,531,403 |
| ශුද්ධ වත්කම් / අයිතිය | 4,645,031,015 |
| මුළු බැරකම් | 6,093,562,418 |
| මුළු ආදායම | 542,304,208 |

| | |
|---|---|
| මුළු වියදම | 764,540,805 |
| ඌනතාවය | 222,236,597 |

## 2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉන්ධන වියදම් (අලකොල්ල හා කොටහගා යන වතු වලට අදාල) | 79,602 | බිල්පත් සහ ධාවන සටහන් |
| විවිධ වියදම් (හුන්නස්ගිරිය,අලකොල්ල,හෙයාපාර් ක් යන වතු වලට අදාල) | 405,208 | බිල්පත් |

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2016 මාර්තු 09 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරියෙකු වෙත 2016 ජුනි සිට සැප්තැම්බර් දක්වා වූ මාස 4 ක කාලය වෙනුවෙන් රු.50,000 බැගින් රු.200,000 ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව මගින් පාලනය කරනු ලබන වතුයායන් 12 ට අදාලව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ වල නිම් තේ නිෂ්පාදනය සැසඳීමේදී පහත කරුණු අනාවරණය විය.

(i) වැවිලි අමාත්‍යාංශයේ 2016 බෝග වගාව පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු වාර්තාව අනුව හෙක්ටයාරයකින් අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය තේ ඵලදාව කිලෝග්‍රෑම් 1695 ක් වුවත් සංස්ථාවේ වතුයායන් වල සමාලෝචිත වර්ෂයේ හෙක්ටයාරයක තේ ඵලදාව කිලෝග්‍රෑම් 176 සිට කිලෝග්‍රෑම් 685 දක්වා වූ අඩු පරාසයක පැවතුණි.

(ii) සංස්ථාවට අයත් වතු 12 න් වතු 10 ක නිම් තේ නිෂ්පාදනය 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය වන විට අඩු වී තිබූ අතර ඒ අතරින් භාගල හා මිඩ්ලන්ඩ් යන වතු දෙකෙහි නිම් තේ නිෂ්පාදනය අදාල කාලය තුල සියයට 49 කින් පමණ අඩු වී තිබුණි.

(iii) සංස්ථාවේ තේ නිෂ්පාදිත භූමි ප්‍රමාණය වන හෙක්ටයාර් 2,669 ක් මගින් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතු සම්මත නිම් තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 4,904,792 ක් විය යුතු වුවත් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදනය කර තිබූ නිම් තේ ප්‍රමාණය කිලෝගෑම් 1,354,531 කි. එනම් සම්මත ඵලදාවෙන් සියයට 28 ක් පමණක් විය.

(ආ) සංස්ථාව සතු හෙක්ටයාර් 2,669 ක් වන භූමි ප්‍රමාණයෙන් තේ වගාව සඳහා බාහිර වගාකරුවන් වෙත හෙක්ටයාර් 1,778 ක් ලබාදී තිබූ අතර ඒ පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) 2015 වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී බාහිර වගාකරුවන් වෙත ලබාදී ඇති භූමි ප්‍රමාණය සියයට 18 කින් වැඩිවුවද ඔවුන් විසින් සපයනු ලැබූ තේ දළු ප්‍රමාණය කිලෝග්‍රෑම් 17,075 කින් එනම් සියයට 15කින් පහළ ගොස් තිබුණි.

(ii) බාහිර පාර්ශවයන් විසින් නඩත්තු කරනු ලබන භූමි ප්‍රමාණය මඟින් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතු සම්මත නිමි තේ නිමැවුම කිලෝග්‍රෑම් 1,997,181ක් වුවත් බාහිර පාර්ශවයන් විසින් සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදනය කර තිබුණේ ඉන් සියයට 5ක ප්‍රමාණයක් පමණි. ඒ අනුව බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබූ ක්ෂේත්‍රයන් මගින් උපරිම ඵලදායිතාවක් ලබා ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වතුයායන් 12 ක ඇස්තමේන්තුගත සහ සත්‍ය තේ නිෂ්පාදනය සැසඳීමේදී පහත කරුණු අනාවරණය විය.

(i) සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් වතුයායන් වෙත ලබා දී තිබූ තේ නිෂ්පාදන ඉලක්කය කිලෝග්‍රෑම් 50,000 ත් කිලෝග්‍රෑම් 487,100 ත් අතර පරාසයක වූ අතර එම වතුයායන් වල සත්‍ය තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 25,774 ත් කිලෝග්‍රෑම් 320,621 ත් අතර පරාසයක එනම් සියයට 35 සිට සියයට 77 ක පරාසයක පැවතුණි. සියයට 35 ක ප්‍රතිශතය කොටගහ වතුයායෙන් වාර්තා විය.

(iii) 2013 වර්ෂයේ සිට සංස්ථාව විසින් වතුයායන් වෙත ලබා දී තිබූ ඇස්තමේන්තු ගත තේ නිෂ්පාදනය එකම වතුයායකටවත් ළඟාකර ගැනීමට නොහැකිව තිබියදී, ඒ පිළිබඳව නිසි අධ්‍යයනයක් නොකර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ද ඉහළ ඉලක්කයන් ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) සංස්ථාවට අයත් වතු 12 හි සමාලෝචිත වර්ෂයේ නිමි තේ කිලෝවක දායකය පෙර වර්ෂය සමග සැසඳීමේදී සෘණ අගයක් ගෙන තිබූ අතර එය රු.28 සිට රු.467 දක්වා පරාසයක පැවතුණි. ඒ අනුව සංස්ථාව විසින් තේ කිලෝග්‍රෑම් එකක් නිපදවීමේදී දැරීමට සිදුවන මූලික පිරිවැය, විකුණුම් ආදායමෙන් ආවරණය කරගත නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි.

(ඉ) 2016 වසරට අදාලව සංස්ථාව මඟින් පාලනය කරනු ලබන වලහන්දුව වතුයායෙහි රබර් කිරි නිෂ්පාදනය, විකුණුම් හා ලාභය පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) වලහන්දුව වතුයායේ රබර් කිරි නිෂ්පාදනයෙන් වූ ලාභය 2011 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.6,803,694 කින් එනම් සියයට 140 කින් පිරිහී තිබුණි. තවද 2011 වර්ෂයට සාපේක්ෂව ඵලදාව සියයට 24 කින් අඩු වී තිබූ අතර රබර් විකුණුම් මිල සියයට 52 කින් අඩු වීම හා ඒකකයක නිෂ්පාදන පිරිවැය සියයට 50 කින් වැඩිවීම ලාභය පිරිහීමට හේතු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ඵලදාව | විකුණුම් වටිනාකම | නිෂ්පාදන පිරිවැය | ලාභය/ (අලාභය) |
|---|---|---|---|---|
| --------- | -------- | -------- | -------- | ------------ |
| | කි.ග්‍රෑ | රු. | රු. | රු |
| 2011 | 49,333 | 469 | 240 | 11,318,050 |
| 2012 | 39,219 | 378 | 289 | 3,405,404 |
| 2013 | 44,863 | 344 | 325 | 845,665 |
| 2014 | 40,741 | 259 | 337 | (3,097,683) |
| 2015 | 36,810 | 231 | 354 | (4,513,701) |
| 2016 | 37,523 | 222 | 361 | (4,514,356) |

(ii) හෙක්ටයාරයක සාමාන්‍යයෙන් පැවතිය යුතු සම්මත රබර් ගස් ප්‍රමාණය 32,500 ක් වුවත් වලහන්දූව වතුයායේ හෙක්ටයාරයක පැවති ගස් සංඛ්‍යාව 20,558 කි. එනම් සම්මත ප්‍රමාණයෙන් සියයට 63 කි.

(iii) 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයක රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 914 ක් වුවත් සමාලෝචිත වර්ෂයේදී වලහන්දූව වතුයායේ හෙක්ටයාරයක රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 577 ක් දක්වා අඩු වී තිබුණි.

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ වතුයායන් 10 කට අයත් ඉවත්කල යුතු අබලි යකඩ ද්‍රව්‍ය ටොන් 500 ඒකක වශයෙන් වෙන් වෙන්ව හඳුනාගෙන තිබියදී, අයිතම වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් තක්සේරු නොකර පොදුවේ යකඩ කිලෝග්‍රෑම් 1 ක් රු.35 බැගින් තක්සේරු කිරීම හේතුවෙන් මෙම අබලි ද්‍රව්‍ය තුල ඇතුලත් වූ විදුලි මෝටර්, ලේත් යන්ත්‍ර, ට්‍රැක්ටර් ටේලර් හා එන්ජින් වැනි ඉහල වටිනාකමකින් යුත් ද්‍රව්‍ය අවතක්සේරු වී තිබුණි. එම යකඩ ටොන් 500, කිලෝග්‍රෑම් 1 ක් රු.35 බැගින් විකිණීම මගින් ලබාගැනීමට ඇස්තමේන්තුගත කර තිබූ ආදායම රු.17,500,000 ක් වුවත් ලබාගෙන තිබූ සත්‍ය ආදායම රු.2,177,120 ක් පමණක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට12 ක් විය.

(ආ) කැලෑබොක්ක වතුයායේ නෙල්ලුමලේ බෙදුමේ ක්ෂේත්‍රයක් සඳහා මාසයකට වාර 4 බැගින් ක්ෂේත්‍ර 6 ක් සඳහා වර්ෂයකට තේ දළු නෙලීම් වාර 288 ක් සිදුකල යුතු වුවත් පසුගිය වර්ෂ 3 ක දත්ත පරීක්ෂා කිරීමේදී වාර්ෂිකව නෙලීම් වාර 190 කට ආසන්න ප්‍රමාණයක් පමණක් ක්‍රියාත්මක කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2003 මාර්තු මාසයේදී නිකුත් කළ උපදේශක චක්‍රලේඛ අංක 04/03 අනුව, තේ පත්‍ර 4-5 දිග හැරුණු පසු ප්‍රධාන අංකුරයේ වැඩීම අක්‍රිය වේ. එය තේ ඵලදාවට හා නිමි තේ වල ගුණත්වය අඩුවීම කෙරෙහි සෘජුවම බලපානු ලබයි. නිමි තේ නිෂ්පාදනයෙන් සම්මත කසල තේ ප්‍රමාණය සියයට 3 ක් වුවද ගුණාත්මකභාවයෙන් අඩු දළු කැලෑබොක්ක කර්මාන්තශාලාව වෙත බාරදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ශාලාවේ කසල තේ ප්‍රතිශතය සියයට 6 ත් සියයට 21 ත් අතර පරාසයක පැවතුණි.

(ඈ) කැලෑබොක්ක වතුයායට අයත් කර්මාන්තශාලාවේ වහලය අළුත්වැඩියා කිරීමට අදාල රු.මිලියන 5කට ආසන්න වටිනාකමකින් යුත් කොන්ත්‍රාත්තුව විධිමත් ගිවිසුමකින් තොරව 2015 ජූලි 25 දිනැති ප්‍රතිග්‍රහන ලිපියක් මගින් පමණක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබුණි. එහිදී එම කාර්යය ඉටුකර නැවත බාරදිය යුතු නිශ්චිත කාලසීමාවක් සඳහන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල කාර්යය නිමකර නොතිබුණි.

(ඉ) ගම්මඩුව වතුයායට අයත් හෙක්ටයාර් 0.152 ක භූමි ප්‍රමාණයක් බදු ගිවිසුම් අංක 1024 මගින් 1999 ජූලි 01 වන දින සංස්ථාව විසින් පුද්ගලික සමාගමක් වෙත වසර 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබාදී තිබුණි. වාර්ෂිකව බදු වැඩිවීම සම්බන්ධව ගිවිසුමේ කොන්දේසි ඇතුලත් කර නොතිබුණු අතර 1995 ජූලි 21 දිනැති අංක එස්ඒඅයි/ඒ/4/34 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයට අනුව වර්ෂ පහකට වරක් සියයට 50 ක බදු වැඩිවීම සංස්ථාව විසින් අයකර ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට අයවිය යුතු හිඟ බදු මුදල රු.1,936,688 ක් වූ අතර ගිවිසුම අනුව අතුරු මාර්ග නඩත්තුව වෙනුවෙන් සංස්ථාවට අයවිය යුතු රු.1,999,500 ක්ද ඇතුළුව රු.3,936,188 ක මුදලක් සංස්ථාව විසින් අයකරගෙන නොතිබුණි.

(ඊ) විහාරගල වතුයායේ නිඩ්වුඩ් කොටසට අයත් අක්කර 232 රූඩ් 03 පර්චස් 02 ක භූමි ප්‍රමාණය 1992 අප්‍රේල් 08 දින සිට බදු පදනමින් බාහිර පාර්ශවයක් වෙත ලබාදී තිබුණ අතර 2007 වර්ෂයේ සිට මෙම බදුකරු විසින් බදු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2011 වර්ෂයේ සිට පුද්ගලික සමාගමක් වෙත නැවත බදු දී තිබුණි. සංස්ථාවේ ඉඩම් අංශයේ වාර්තා අනුව 2016 දෙසැම්බර් 31 දිනට මුල් බදුකරුගෙන් අයවිය යුතුව පැවති හිඟ බදු මුදල රු.1,559,250 ක් විය. වර්තමානය වනවිට බදු දී ඇති භූමියෙන් අක්කර 110 ක් පමණ අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් සංස්ථාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) කැලෑබොක්ක වතුයායේ හෙක්ටයාර් 218 ක තේ වගාවන් වසර 50 කට වඩා පැරණි බැවින් එම ප්‍රදේශයේ තේ ගස් ගලවා නැවත වගා කළ යුතු තත්ත්වයේ පැවතියද ඵලදායී ජීව කාලය ඉක්මවූ වගාවන් ඉවත්කර නැවත වගා කිරීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කැලෑබොක්ක කර්මාන්තශාලාවේ තේ නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධ " Michi Shifter " යන්ත්‍රයේ කසල තේ ඉවත්කිරීමේ උපාංගය වර්ෂයකට වැඩි කාලයක සිට අක්‍රීය තත්ත්වයේ පැවතීම හා එමගින් කසල තේ ඉවත් නොවීම හේතුවෙන් නිෂ්පාදිත තේ වල කසල තේ අඩංගුව පැවති බව තේ සාම්පල තක්සේරු වාර්තා මඟින් නිරන්තරයෙන් පෙන්වා දී තිබුණි. එසේ වුවද එම යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 ඔක්තෝබර් 12 දිනැති අංක 115 දරන බදු ගිවිසුම මඟින් ගම්මඩුව වතුයායේ හෙක්ටයාර් 222 ක භූමි ප්‍රමාණයක් වසරකට රු.694,000 ක මුදලකට වසර 30 ක් සඳහා ගම්මඩුව වැව්ලි පුද්ගලික සමාගම වෙත බදු පදනම මත ලබාදී තිබූ අතර, 2011 වර්ෂයේ සිට 2016 ඔක්තෝබර් 11 දින දක්වා ඒ වෙනුවෙන් අයකර ගත යුතු හිඟ බදු මුදල රු.3,470,000 ක් අයකර ගෙන නොතිබුණි.

**3.4 හඳුනාගන්නා ලද පාඩු**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වතුයාය තුළ නව තේ වගාවන් ආරම්භ නොකිරීම හේතුවෙන් කැලෑබොක්ක වතුයාය සතුව පැවති තේ පැල තවානක පැල 26,533 ක් වගාකිරීම සඳහා නිකුත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ සඳහා රු.809,939 ක් වැයකර තිබූ අතර මෙම බීජ පැල නැවත වගාකළ නොහැකි ලෙස පොළවට මුල් අල්ලා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) පෞද්ගලික තේ කර්මාන්තශාලාවක් විසින් 2016 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසයන්හි සංස්ථාව සමග සමාන තේ දළු සැපයුම්කරුවකු වූ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදී තිබූ මිලට වඩා අඩු මිලක් සංස්ථාවේ තේ දළු කිලෝග්‍රෑම් 407,558 ක් සඳහා ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.2,404,407 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ අනුමැතියකින් තොරව හා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් බැහැරව අලකොල්ල වතුයායේ වතු අධිකාරී විසින් ඔහු හට අනුමත වියදම් දැරීමේ සීමාවද ඉක්මවා වෙළඳපල මිලට වඩා වැඩි මිලක් ගෙවමින් පුද්ගලික වතුයායක් වෙතින් රසායනික ද්‍රව්‍ය ලීටර් 36 ක් මිලදී ගැනීම හේතුවෙන් සංස්ථාවට රු.21,982 ක අලාභයක් සිදුව තිබුණි.

## 3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කැලැබොක්ක කර්මාන්තශාලාවේ මහල් දෙකකින් සමන්විත දළු හැකිලීමේ අංශය තුල කිලෝග්‍රෑම් 23,585 ක උපරිම නිෂ්පාදනයක් සඳහා අමුදළු කිලෝග්‍රෑම් 32,756 ක් රැස්කිරීමේ හැකියාව තිබියදී, දළු කිලෝග්‍රෑම් 11,600ක් පමණක් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදවා තිබුණි. ඒ අනුව සමස්ථ ධාරිතාවයෙන් සියයට 64 ක් ඌන උපයෝජිත මට්ටමේ පැවති බව නිරීක්ෂණය විය.

(ආ) කැලැබොක්ක වතුයායට අයත් බංගලා හා නිල නිවාස නඩත්තු නොකිරීම හේතුවෙන් ඒවා විශාල වශයෙන් පරිහානියට පත්ව ඇති අතර ක්ෂේත්‍ර කීපයකට අයත් නිල නිවාස හා බංගලා 8 ක් භාවිතයට ගැනීමකින් තොරව අතහැර දමා තිබූ බව 2017 පෙබරවාරි 02 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) තේ නිෂ්පාදනය නවතා දමා ඇති හුන්නස්ගිරිය තේ කර්මාන්තශාලාව තුල තේ දළු ඇඹරීම සඳහා යොදාගන්නා යන්ත්‍ර සූත්‍ර, විදුලි උත්පාදක යන්ත්‍ර හා අනෙකුත් උපකරණ සහ හුන්නස්ගිරිය ඉහල කොටස තුළ පිහිටි සහකාර වතු අධිකාරී බංගලාව වසර කිහිපයක සිට නිෂ්කාර්යව පැවති බව 2017 පෙබරවාරි 02 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඈ) කැලැබොක්ක කර්මාන්තශාලාවේ ඇඹරුම් අංශයේ සීටීසී (CTC) ක්‍රමයට දළු අඹරනු ලබන ඇඹරුම් පද්ධති 03 ක් පවතින අතර, ඉන් පළමු පද්ධතිය වසර කිහිපයක සිට සම්පූර්ණයෙන්ම භාවිතයෙන් ඉවත්කර තිබුණි. තවද, දෙවන ඇඹරුම් පද්ධතියේ පැයට කිලෝග්‍රෑම් 1300 ක ධාරිතාවකින් යුත් ඇඹරුම් යන්ත්‍රය ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකරන ලද 2017 පෙබරවාරි 02 දින වන විට අළුත්වැඩියා කටයුතු සඳහා ගලවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වන විටත් අළුත් වැඩියාවන් සඳහා යොමුකර නොතිබුණි. මේ අනුව මෙම ඇඹරුම් යන්ත්‍ර දෙකම කර්මාන්ත ශාලාවේ භාවිතය සඳහා යොදා ගෙන නොතිබුණි. තවද පැයට කිලෝග්‍රෑම් 1200 ක සම්මත ධාරිතාවයෙන් යුතු තෙවන ඇඹරුම් පද්ධතියේද පැයට කිලෝග්‍රෑම් 650 ක් එනම් සම්මත ධාරිතාවයෙන් සියයට 54 ක් තරම් අඩු ධාරිතාවයකින් උපයෝජනය කර පැවති බව නිරීක්ෂණය විය.

(ඉ) 1983-1985 කාලපරිච්ඡේදයට අදාලව ෆර්ගසන් වතු නාමාවලියට අනුව ගම්මඩුව වතුයාය සතු මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1624 ක් වන අතර ඉන් බදු ගිවිසුම් අංක 371 මඟින් ගම්මඩුව වැවිලි සමාගම වෙත ලබාදී තිබූ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 573 කි. ඒ අනුව ඉතිරි ඉඩම් හෙක්ටයාර් 1051 ක ප්‍රමාණය සංස්ථාව විසින් හඳුනාගෙන උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 1994 අප්‍රේල් 21 දිනැති අංක 815/ඞී දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් වැවිලි සංස්ථාව වෙත පැවරී ඇති පර්ත් වතුයායේ වෝටර් ලෑන්ඩ් කොටසේ රූඞ් 1 පර්චස් 37.2 ක පිහිටි බංගලාව හා අක්කර 4.33 ක පොල් වගාව වර්තමානය වන විට පුද්ගලික සමාගමක් විසින් භාවිතා කරනු ලබයි. නමුත් මෙම දේපල පුද්ගලික සමාගම වෙත නීත්‍යානුකූලව පැවරීමට

අදාල කිසිදු තොරතුරක් සංස්ථාව සතුව නොතිබුණු අතර එම දේපල නැවත අත්පත් කර ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) කැලැබොක්ක කර්මාන්ත ශාලාවේ වියලුම් අංශයේ පැවති නිෂ්පාදන ධාරිතාවය පැයකට තේ දළු කිලෝග්‍රෑම් 682 ක් වූ අතර 2016 වර්ෂය තුලදී දළු නෙලීම සිදුකල දින 251 ක් පුරා උක්ත ධාරිතාවය තුල අමු දළු කිලෝ 1,368,954 ක් නිෂ්පාදන කටයුතු සඳහා යොදාගත හැකිව තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී නෙලන ලද දළු ප්‍රමාණය කිලෝග්‍රෑම් 1,337,683 ක් වුවද යෙදවුම් ක්‍රියාවලිය සඳහා තේ දළු කිලෝග්‍රෑම් 502,504 ක් පමණක් (එනම් සියයට 37 ක්) යොදාගෙන තිබුණු අතර ඉතිරි දළු ප්‍රමාණය බාහිර ගැනුම්කරුවන් වෙත අලෙවි කර තිබුණි.

### 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වන පරිච්ඡේදය අනුව එක් එක් තනතුරු සඳහා සකස් කරන ලද බඳවා ගැනීමේ පරිපාටියක් සංස්ථාව සතුව නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ විගණන සැලැස්ම අනුව වතුයායන් 14 ක්, ප්‍රාදේශීය කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ආවරණය වන පරිදි විගණන වැඩසටහන් 28 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද, වතුයායන් 5 ක් හා ප්‍රධාන කාර්යාලයේ අංශ 2 ක් පමණක් පරීක්ෂාකර විගණන වාර්තා ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් තම සැලසුම්ගත ඉලක්ක ලඟාකර ගෙන නොතිබුණි.

### 4.2 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මාස 03 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ලේඛන පවත්වා ගැනීම | මූලාශ්‍ර ලේඛන නිසිපරිදි නඩත්තුකර නොතිබීම. |
| (ආ) | අයවැය පාලනය | අයවැයගත ඉලක්ක සපුරාගැනීම අධීක්ෂණය කිරීම පහළ මට්ටමක පැවතීම හා කාර්යසාධනය වර්ධනය කරගැනීමට අදාල තාක්ෂණික මෙවලම් සහ ක්‍රියාවලින් භාවිතා නොකිරීම. |
| (ඇ) | කර්මාන්තශාලා යන්ත්‍ර උපයෝජනය | ධාරිතාවය උපරිම ලෙස ප්‍රයෝජනයට නොගැනීම. |

| | | |
|---|---|---|
| (ඇ) | වත්කම් උපයෝජනය | නිල නිවාස ඌන උපයෝජනය හා නිසි කලට අළුත්වැඩියාවන් නොකිරීම. |
| (ඉ) | වගාවන් නඩත්තු කිරීම | උපරිම ඵලදාවක් ලැබෙන අයුරින් වතුවල වගාවන් නඩත්තු නොකිරීම. |
| (ඊ) | සේවක කළමනාකරණය | සේවකයින්ට නිසිපරිදි වගකීම්, රාජකාරි පවරා දී නොතිබීම. |
| (උ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන සැලැස්ම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොකිරීම. . |